# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022

2025 ජූලි

සමාජීය විද්‍යා පීඨය

## පුස්තකාල හා විඥාපන විද්‍යාව
(නව නිර්දේශය)

## පුස්තකාල සඳහා පරිගණක භාවිතය හා පුස්තකාල පුහුණුව
## LISC 38224

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. i. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙහි දැකගත හැකි සංරචක 5ක් නම් කරන්න. (ලකුණු 05)

ii. දත්ත හා තොරතුරු අතර ඇති වෙනස උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

iii. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙහි කාර්යයන් මොනවාද? (ලකුණු 02)

iv. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයේ ඇති අභියෝග විස්තර කරන්න. (ලකුණු 05)

v. දත්ත පවතින ආකාරයන් 4ක් නම් කරන්න. (ලකුණු 02)

02. i. "පුස්තකාල කටයුතු සඳහා ICT භාවිතය සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා ඵලදායී වේ." උක්ත කරුණ ඔබේ මතයට අනුව සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

ii. "ඩිජිටල් පුස්තකාලය" (Digital Library) සහ "සාම්ප්‍රදායික පුස්තකාලය" අතර වෙනස්කම් පිළිබඳව විමසන්න. (ලකුණු 10)

03. පුස්තකාලයක් සඳහා විවෘත මෘදුකාංග (Open Source Software) භාවිත කිරීමේ වැදගත්කම ඇගයීමට ලක් කරන්න. (ලකුණු 20)

04. i. පුස්තකාල ස්වයංක්‍රීයකරණය යන්න සුදුසු නිර්වචන යොදාගනිමින් විස්තර කරන්න. (ලකුණු 06)

ii. පුස්තකාල ස්වයංක්‍රීයකරණය සඳහා පවතින වාණිජමය මෘදුකාංග 4ක් නම් කරන්න. (ලකුණු 04)

iii. KOHA මෘදුකාංගයේ "පරිශීලක අතුරුමුහුණත" (User-Friendly Interface) සහ "උසස් වාර්තාකරණ හැකියාවන්" අතර සම්බන්ධතාව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

05. ABC පුස්තකාලය ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා එහි පුස්තකාලයාධිපතිවරයාට අවශ්‍යව පවතී. එම පුස්තකාලයෙහි තොරතුරු තාක්ෂණ පුස්තකාලයාධිපතිවරයා වශයෙන් ඔබ එහි සේවය කරනු ලබන අතර ඉහත පුස්තකාලය ස්වයංක්‍රීයකරණය කිරීමට ඇති පියවර පිළිබඳව විමර්ශනය කරන්න. (ලකුණු 20)

06. i. KOHA මෘදුකාංගය යනු කුමක්ද? එහි ප්‍රධාන අරමුණු 02ක් ලියන්න. (ලකුණු 04)

ii. KOHA මෘදුකාංගය තුළ භාවිත වන තත්ත්ව සහතිකයන් 4ක් නම් කරන්න. (ලකුණු 04)

iii. පුස්තකාල ස්වයංක්‍රීයකරණ මෘදුකාංගයක් වන කොහා මෘදුකාංගය නිර්මාණය කර ඇති කොටස් නම් කරන්න. (ලකුණු 2x4=8)

අ) Server operating system :...............................

ආ) Web server :...............................................

ඇ) Programming language:..................................

ඈ) Database:..................................................

iv. KOHA මෘදුකාංගයේ පවතින ප්‍රධාන මොඩියුල 04ක් නම් කරන්න. (ලකුණු 04)

07. "පුස්තකාලවල ක්‍රියාත්මක විවිධ සේවා හා එකී සේවා පිළිබඳ නවක සේවකයන් පුහුණු කිරීම පුස්තකාලයක කාර්යක්ෂම සේවා සම්පාදනයට හේතු වේ.

i. පුස්තකාල පුහුණුව යනු කුමක්ද? (ලකුණු 05)

ii. පුස්තකාල පුහුණුව ලබාදීමේ අරමුණු කවරේද? (ලකුණු 05)

iii. පුස්තකාලයක නව සේවකයන් පුහුණු කළ යුතු අංශ විස්තර කරන්න. (ලකුණු 10)

08. උපාධි අපේක්ෂකයෙකුට තම අධ්‍යයන සාර්ථකත්වය සඳහා පුස්තකාල සම්පත් ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා අනුගමනය කළ හැකි උපාය මාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 20)

************************